# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1434/5 – 2006 පෙබරවාරි 27 වැනි සඳුදා – 2006.02.27

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1991.02.27 දින අංක 651/8 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ව්‍යවස්ථා සංග්‍රහය වෙනුවට පහත දැක්වෙන ශ්‍රී ලංකා මිනින්දෝරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය ආදේශ කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අණපරිදි,

ලේකම්.

2006 ජනවාරි මස 20 වැනි දින,

ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය

1. 1991.02.27 දින අංක 651/8 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ ශ්‍රී ලංකා මිනින්දෝරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය සහ එම ව්‍යවස්ථා සංග්‍රහයට වරින් වර කරනු ලැබූ සංශෝධනයන් ප්‍රකාර විධිවිධානයන් අනුව ගන්නා ලද හෝ ඒ යටතේ ගන්නා ලදැයි අදහස් කරන ලද හෝ කිසියම් පියවරකට හානියක් නොවන පරිදි මෙම ව්‍යවස්ථා සංග්‍රහය 2005.08.01 දින සිට ක්‍රියාත්මක විය යුතුය.

2. නිර්වචනය :

*"ගැසට් පත්‍රය" යනුවෙන් අදහස් කෙරෙනුයේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයයි*

"සේවා ව්‍යවස්ථාව" යන්නෙන් අදහස් කරනුයේ ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය පිළිබඳ ව්‍යවස්ථාව වේ.

"නියමිත දිනය" යනුවෙන් අදහස් කරනුයේ මෙම ව්‍යවස්ථාව ක්‍රියත්මක වීමට ආරම්භ වන දිනය වේ.

"රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ රා. සේ. කො" යනුවෙන් අදහස් කරනුයේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54 වැනි ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව පත් කරනු ලබන රාජ්‍ය සේවා කොමිෂන් සභාව වේ.

"ලේකම්" යනුවෙන් අදහස් කෙරෙන්නේ මිනින්දෝරු විෂය භාර අමාත්‍යාංශයේ විෂය භාර ලේකම්වරයාය.

"සේවය" යනුවෙන් අදහස් කරනුයේ ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයයි

3. ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය, මෙම ව්‍යවස්ථාවට යාකොට ඇති ("ඇ" පරිශිෂ්ඨයේ දැක්වෙන) ඕනෑම දෙපාර්තමේන්තුවක එම සේවයේ පහත සඳහන් කර ඇති පන්තිවලට හෝ ශ්‍රේණිවලට පත් කරන ලද රාජ්‍ය නිලධාරීන්ගෙන් සමන්විත වනු ඇත.

i. තෝරාගත් පන්තිය

ii. I පන්තිය

iii. I I / I ශ්‍රේණිය

iv. II/II ශ්‍රේණිය

4. **තනතුරු නාමය, සංඛ්‍යාව හා පන්තිය :**

| | *තනතුරු නාමය* | *සංඛ්‍යාව* | *පන්තිය/ශ්‍රේණිය* |
|---|---|---|---|
| i. | සර්වේයර් ජනරාල් | 01 | තෝරාගත් පන්තිය |
| ii. | අතිරේක සර්වේයර් ජනරාල් | 02 | තෝරාගත් පන්තිය |
| iii. | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් | 05 | I පන්තිය |
| iv. | නියෝජ්‍ය සර්වේයර් ජනරාල්/පළාත් සර්වේයර් ජනරාල් | 13 | I පන්තිය |
| v. | ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි | 49 | I පන්තිය |
| vi. | මිනින්දෝරු අධිකාරි | 139 | I I /I |
| vii. | සහකාර මිනින්දෝරු අධිකාරි/මිනින්දෝරු | 850 | II /II |

**සටහන :** දැනට සහකාර මිනින්දෝරු අධිකාරි තනතුරු දරන නිලධාරීන් හට ඔවුන්ට පෞද්ගලික වන සේ මෙම තනතුරු නාමය තවදුරටත් දැරිය හැකිය. ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ II /II පන්තියේ තනතුරු නාමය "මිනින්දෝරු" යන්න වේ.

5. **වැටුප් පරිමාණය :**

| *පන්තිය* | *වැටුප් කාණ්ඩය* | *වැටුප් පරිමාණය* |
|---|---|---|
| i. තෝරාගත් පන්තිය | ටීකී 8-1 | 3,45,600-8×12,360-4,44,480 |
| ii. I පන්තිය | ටීකී 7-1 | 2,76,540-10×11,880-3,95,340 |
| iii. I I /I පන්තිය | ටීකී 6-1 | 2,14,980–2×7,740–5×8,580– 2,73,360 |
| iv. II/II පන්තිය | ටීකී 5-1-2 | 1,57,500-15×3780-2,14,200 |

6. **පත්කිරීමේ ක්‍රමය :**

II/II පන්තියට පත් කිරීම

මිනින්දෝරු සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරු දරන පහත සුදුසුකම් සහිත අයගෙන් රාජ්‍ය සේවා කොමිෂම විසින් බඳවා ගනු ලැබේ.

(i) පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් ආයතනයකින් මැනුම් විද්‍යාව පිළිබඳව හෝ භෞතික විද්‍යාව පිළිබඳව (ගණිතය ද ඇතුළත්ව) විද්‍යාවේදී උපාධියක් තිබීම

සහ

(ii) මැනුම් විද්‍යා උපාධිධාරීන් මාස 06 ක දෙපාර්තමේන්තු කටයුතු පිළිබඳ පුහුණුවක් සමග මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරුවරයෙකු ලෙස වසර 4 ක් සතුටුදායක ලෙස සේවය කර තිබීම

හෝ

(iii) භෞතික විද්‍යා උපාධිධාරීන් මැනුම් විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් සමග මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දොරුවරයෙකු ලෙස වසර 6 ක් සතුටුදායක ලෙස සේවය කර තිබීම

6.1 මිනින්දෝරු සේවයෙන් පරිබාහිර ආධුනික මිනින්දෝරු තනතුර සඳහා පත්කිරීමේ ක්‍රමය (අ) පරිශිෂ්ඨයේ ඇතුළත්වේ.

7. අන්තර්ග්‍රහණය :

II /II සහ II /I පන්තිය ඒකාබද්ධ පන්තියක් ලෙස සලකනු ලැබේ.

7.1 III/I, III/II, III/IIIපන්තියේ මිනින්දෝරුවරුන් II /II පන්තියට පහත සඳහන් පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(i) අවුරුදු 03 ක සේවා කාලයක් ඇති මැනුම් විද්‍යා උපාධිධාරීන් යෝජක සේවා ව්‍යවස්ථාවේ II /II පන්තියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(ii) අවුරුදු 05 ක සේවා කාලයක් සහ මැණුම් විද්‍යාව පිළිබඳ උසස් ඩිප්ලෝමාවක් සහිත භෞතික විද්‍යා උපාධිධාරීන් II /II පන්තියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(iii) දැනට ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ III/I, III/II, සහ III/IIIපන්තියේ තනතුරු දරන නියමිත දිනට කණිෂ්ඨ වෘත්තීය පරීක්ෂනයෙන් (JPE) සමත් අවුරුදු 15 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් අධිසේවක පදනම මත ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ II පන්තියේ II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(iv) ඉහත 7.1 (1) යටතේ සුදුසුකම් සම්පූර්ණ කර නැති නිලධාරීන් අවශ්‍ය සුදුසුකම් සපුරා ගන්නා තෙක් දැනට දරන තනතුරෙහිම තබනු ඇත. නමුත් වෘත්තීය පරීක්ෂණය (JPE) සමත් නොවුවත් ඔවුන් වසර 20 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නම් අධිසේවක පදනම මත ඔවුන්ට පෞද්ගලික වන සේ ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ II පන්තියේ II වැනි ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(v) ඉහත සඳහන් II /II පන්තියට අන්තර්ග්‍රහණය කිරීමට සුදුසුකම් නොලබන මිනින්දෝරුවරුන් II /II පන්තියටඅන්තර්ග්‍රහණය කිරීමට සුදුසුකම් ලබනතෙක් වර්තමාන පන්තියේ/ශ්‍රේණියේ සිටිය යුතුය.

7.2 II /II පන්තියේ සහකාර මිනින්දෝරු අධිකාරීන්/මිනින්දෝරුවරුන් ලෙස අවුරුදු 10 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සහ උසස්වීම් සහා සුදුසුකම් ලැබීමට නියමිත දිනට පූර්වාසන්න අවුරුදු 5 ක කාලයක් තුළ සතුටුදායක සේවාවක් සම්පූර්ණ කර ඇති පවතින සේවා ව්‍යවස්ථාවේ අවශ්‍යතාවයන් අනුව සුදුසුකම් ලබන සහකාර මිනින්දෝරු අධිකාරීන්/මිනින්දෝරුවරුන් II / II පන්තියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

7.3 II /II පන්තියේ සහකාර මිනින්දෝරු අධිකාරීන්/මිනින්දෝරුවන් ලෙස සේවය කරන නිලධාරීන් ඔවුන් II /II හි අවුරුදු 10 ක සේවා කාලයක් සම්පූර්ණ කරන අවස්ථාවේදී 2 වැනි කාර්යක්ෂමතා කඩඉම සමත්වී නොමැති නම් සහ පූර්වාසන්න අවුරුදු 5 ක කාලයක් තුළ සතුටුදායක සේවාවක් සම්පූර්ණකර ඇතිනම් අනෙකුත් සහකාර මිනින්දෝරු අධිකාරීන්ගේ ජ්‍යෙෂ්ඨත්වයට හානි නොවනසේ සහ තවදුරටත් I පන්තියේ පත්වීම සඳහා හිමිකම් නොමැති වන සේ II/I පන්තියට අන්තර්ග්‍රහණය කෙරේ. මෙම සහනය මෙම ව්‍යවස්ථා සංග්‍රහය ක්‍රියාත්මක වන 2005.08.01 දිනට සහකාර මිනින්දෝරු අධිකාරීන්/මිනින්දෝරුවන් ලෙස සේවය කරන නිලධාරීන්ට පමණක් අදාළ වේ.

7.4 මිනින්දෝරු අධිකාරි තනතුරු දරන්නන් I පන්තියේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි තනතුරට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

7.5 නියෝජ්‍ය සර්වේයර් ජනරාල් තනතුරු දරන්නන් I පන්තියේ නියෝජ්‍ය සර්වේයර් ජනරාල්/පළාත් සර්වේයර් ජනරාල් තනතුරට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

7.6 ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් තනතුරු දරන්නන් I පන්තියේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් තනතුරට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

7.7 අතිරේක සර්වේයර් ජනරාල් තෝරාගත් පන්තියේ අතිරේක සර්වේයර් ජනරාල් තනතුරට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

7.8 සර්වේයර් ජනරාල්, තෝරාගත් පන්තියේ සර්වේයර් ජනරාල් තනතුරට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

8. උසස්වීම් :

8.1 II/I පන්තියට උසස් කිරීම

II /II පන්තියේ අවුරුදු 10 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන හා සේවයේ ස්ථිර කරන ලද පහත දැක්වෙන සුදුසුකම් සහිත II /II පන්තියේ නිලධාරීන් II /I පන්තියට උසස් කරනු ලැබේ.

(i) I හා II කාර්යක්ෂමතා කඩඉම් නියමිත දිනට සමත්වී තිබීම

(ii) උසස්වීම් සඳහා සුදුසුකම් ලැබීමට නියමිත දිනට පූර්වාසන්න අවුරුදු 05 ක කාලයක් තුළ නියමිත දිනයන්හි වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබීම

(iii) උසස්වීම් සඳහා සුදුසුකම් ලැබීමට නියමිත දිනට පූර්වාසන්න අවුරුදු 05 කාලසීමාවක් තුළ කර ඇති වරදක් සඳහා විනයානුකූලව දඬුවමකට භාජනය නොවීම

I පන්තියට උසස් කිරීම.

කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්වී II /I පන්තියට උසස්වීම් ලද II /I පන්තියේ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති මිනින්දෝරු අධිකාරීන් පවත්නා පුරප්පාඩු අනුව හා ජ්‍යෙෂ්ඨත්වය මත I පන්තියේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි තනතුරට උසස් කෙරේ.

I පන්තියේ සතුටදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරීන් පවත්නා පුරප්පාඩු අනුව හා ජ්‍යෙෂ්ඨත්වය මත I පන්තියේ නියෝජ්‍ය සර්වේයර් ජනරාල්/පළාත් සර්වේයර් ජනරාල් තනතුරු සඳහා උසස් කෙරේ.

I පන්තියේ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නියෝජ්‍ය සර්වේයර් ජනරාල්/පළාත් සර්වේයර් ජනරාල්වරුන් පවත්නා පුරප්පාඩු අනුව හා ජ්‍යෙෂ්ඨත්වය මත I පන්තියේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් තනතුරු සඳහා උසස් කෙරේ.

8.2 තෝරාගත් පන්තියට උසස් කිරීම : I පන්තියේ නිලධාරීන් අතුරෙන් ජ්‍යෙෂ්ඨතම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල්වරුන් දෙදෙනා තෝරාගත් පන්තියේ අතිරේක සර්වේයර් ජනරාල් තනතුරුවලට පත්කරනු ලැබේ.

අතිරේක සර්වේයර් ජනරාල් දෙදෙනා අතුරෙන් ජ්‍යෙෂ්ඨතමයා තෝරාගත් පන්තියේ සර්වේයර් ජනරාල් තනතුරට පත්කරනු ලැබේ.

9. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය : ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ II /II පන්තියේ නිලධාරියකුගේ 04 වැනි වාර්ෂික වැටුප් තලයට එළඹීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ද, 7 වැනි වැටුප් තලයට එළඹීමට පෙර දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ද සමත් විය යුතුය.

කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පිළබඳ විස්තර (ආ) පරිශිෂ්ඨයෙහි දැක්වේ.

10. මාරු කිරීම් හා තනතුරුවලට පත්කිරීම : සෑම නිලධාරියෙක්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී ඇත්තේය. රාජ්‍ය සේවයේ අවශ්‍යතාවය මත ඕනෑම නිලධාරියෙකු ඕනෑම ස්ථානයකට ස්ථාන මාරු කළ හැකිය. ස්ථානමාරු කිරීමේදී නිලධාරියාගේ දැනුම හා කුසලතාවය අනුව වඩාත් ඵලදායි වන අන්දමට රාජකාරි පැවරීමට කටයුතු කළයුතුය.

11. ජ්‍යෙෂ්ඨත්වය : තරඟ විභාග ප්‍රතිඵල මත බඳවා ගන්නා ලද අවස්ථාවකදී ජ්‍යෙෂ්ඨත්වය තීරණය කිරීමේ නිර්නායකය වනුයේ තරඟ විභාගයේදී ඒ ඒ අපේක්ෂකයින් ලබාගත් ලකුණු මට්ටමයි.

සම්මුඛ පරීක්ෂණ මත උසස් කරනු ලබන්නේ නම් සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් ස්ථානය ජ්‍යෙෂ්ඨත්වය තීරණය කිරීම සඳහා අදාල වේ.

අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධාරීන් පූර්ව පන්තියේ හා තනතුරෙහි තමන් ලබා සිටි ජ්‍යෙෂ්ඨත්වය පදනම් කරගෙන නව තනතුරුවල ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨත්වය තීරණය කරනු ලැබේ. ජ්‍යෙෂ්ඨත්වය තීරණය කිරීම පිළිබඳව මීට පරිබාහිර අවස්ථාවන්හිදී ආයතන සංග්‍රහයේ විධිවිධාන උපයෝගී කරගත යුතුය.

12. **විශ්‍රාම ගැන්වීම හා දීප ව්‍යාප්ත සේවා ගණයට ඇතුළත් කිරීම :** මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ නියුක්තව සිටි නිලධාරීන්ට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 7 වැනි වගන්තිය යටතේ විශ්‍රාම ගැනීමේ මනාපය ප්‍රකාශ කිරීමේ වරප්‍රසාදය පිරිනැමිය යුතු තරමට මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධානවලින් අහිතකර බලපෑමක් ඇතිවී ඇතැයි රාජ්‍ය සේවා කොමිෂන් සභාව සෑහීමකට පත් වන්නේ නම් 2005.08.01 දින සිට අවුරුදු 5 ක් ඇතුළත එම මනාපය ප්‍රයෝජනයට ගැනීමට යටත්ව ඔහු ඉල්ලීමක් කළහොත් එසේ විශ්‍රාම ගැනීමට ඉඩදෙනු ඇත.

1989 නොවැම්බර් 15 වැනි දින අංක 56/89 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (1) ආ ඡේදයෙහි ඇතුළත් දීප ව්‍යාප්ත සේවා ගණයට ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයද ඇතුළත් වේ.

13. **ආධුනික මිනින්දෝරු තනතුරු සඳහා පත්කිරීමේ ක්‍රමය :** නියමිත සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසුව මිනින්දෝරු සේවයේ II/II පන්තියේ පවතින පුරප්පාඩු පිරවීමට හැකිවන සේ මිනින්දෝරු සේවයෙන් පරිබාහිරව මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුර සඳහා විභාග කොමසාරිස් විසින් පවත්වනු ලබන විවෘත තරඟ විභාගයක ප්‍රතිඵල මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බඳවා ගැනීම් කරනු ලැබේ. (තරඟ විභාගය පිළිබඳ විස්තර ‘අ’ පරිශිෂ්ඨයේ සඳහන් වේ).

13.1 **සුදුසුකම් :** විවෘත තරඟ විභාගයට ඉදිරිපත් වීම සඳහා පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුය.

(i) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.

(ii) ඉල්ලුම්පත් භාර ගැනීමේ අවසන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 33 ට නොවැඩි විය යුතුය.

(iii) පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් ආයතනයකින් මැනුම් විද්‍යාව පිළිබඳව හෝ භෞතික විද්‍යාව පිළිබඳව (ගණිතය ද ඇතුළත්ව) විද්‍යාවේදී උපාධියක් තිබීම.

(iv) විශිෂ්ඨ චරිතයකින් යුක්ත මනා ශාරීරික යෝග්‍යතාවයක් ඇති හොඳ ඇස් පෙනීමකින් යුක්ත පුද්ගලයකු විය යුතුය.

13.2 ඉල්ලුම් කිරීමේ ක්‍රමය : *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයක් මගින් සුදුසුකම් ලත් අයදුම්කරුවන් අතුරෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

13.3 බඳවා ගනු ලබන සංඛ්‍යාව : මිනින්දෝරු සේවයේ සිටින මිනින්දෝරුවරුන් සහ මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරුවරුන් යන කණ්ඩායම් දෙකෙහි මුළු එකතුව 850 නොඉක්මවන සේ ආධුනික මිනින්දෝරුවරුන් බඳවාගත හැකිය. ආධුනික මිනින්දෝරු තනතුරුවලට බඳවා ගැනීමේදී බඳවා ගනු ලබන සඛ්‍යාවෙන් 90% ක් උක්ත සුදුසුකම් සහිත උපාධිධාරීන්ගෙන් විවෘත තරඟ විභාගයක් මගින් පුරවනු ලබන අතර ඉතිරිය උසස්වීමේ ක්‍රියාමාර්ගයක් ලෙස මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ තාක්ෂණික ශ්‍රේණීන්හි සේවය කරන උක්ත සුදුසුකම් සහිත නිලධාරීන්ගෙන් සම්මුඛ පරීක්ෂණයක් මගින් පුරවනු ලැබේ. එසේ වුවද ආධුනික මිනින්දෝරුවරුන් වශයෙන් පුහුණු කිරීම සඳහා තෝරා ගැනීමට ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් දෙපාර්තමේන්තුවේ තාක්ෂණික ශ්‍රේණීන්හි නොමැති නම් එම පුරප්පාඩු ද විවෘත තරඟ විභාගය මගින් තෝරාගත් උපාධිධාරීන් බඳවා ගැනීමෙන් පුරවනු ලැබේ.

13. 4 පුහුණු කිරීම් : විවෘත තරඟ විභාගයේ ප්‍රතිඵල මත ආධුනික මිනින්දෝරු තනතුරට පත් කරනු ලබන මැනුම් විද්‍යා උපාධිධාරීන් මාස 06 ක දෙපාර්තමේන්තු කටයුතු පිළිබඳ පුහුණුවක් ද, භෞතික විද්‍යා උපාධිධාරීන් මැනුම් විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ද, මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයේදී සාර්ථකව නිමකල යුතුය.

13.5 වැටුප් කාණ්ඩය හා වැටුප් පරිමාණය : ආධුනික මිනින්දෝරු තනතුර මිනින්දෝරු සේවයෙන් පරිබාහිර තනතුරක් වන අතර, ආධුනික මිනින්දෝරු තනතුර සඳහා බඳවා ගනු ලබන නිලධාරීන් පහත වැටුප් පරිමාණයේ තබනු ඇත.

TB-15-1 1,35,360-4×2,220-14×3,480-1,92,960

13.6 සේවය ස්ථිර කිරීම : ආධුනික මිනින්දෝරු තනතුර සඳහ බඳවාගනු ලබන මැනුම් විද්‍යා උපාධිධාරීන් දෙපාර්තමේන්තු කටයුතු පිළිබඳ පුහුණුව සාර්ථකව නිමකර පුහුණු කාලය සමග වසර 4 ක සතුටුදයක ලෙස සේවය සම්පූර්ණ කිරීමෙන් පසුව මිනින්දෝරු සේවයේ II /II පන්තියට පත්කර සේවයේ ස්ථිර කරනු ලබේ.

ආධුනික මිනින්දෝරු තනතුර සඳහා බඳවා ගනු ලබන භෞතික විද්‍යා උපාධිධාරීන් මැනුම් විද්‍යා උපාධිය සාර්ථකව නිමකර පුහුණු කාලය සමග වසර 6 ක් සතුටුදායක ලෙස සේවය සම්පූර්ණ කිරීමෙන් පසුව මිනින්දෝරු සේවයේ II /II පන්තියට පත්කර සේවයේ ස්ථිර කරනු ලැබේ.

14. මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන සලසා නොමැති කරුණු : මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන සලසා නොමැති කරුණක් වෙතොත් එය මිනින්දෝරු දෙපාර්තමේන්තුව විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් විමසා රාජ්‍ය සේව කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.

පරිශිෂ්ඨය : (අ) ආධුනික මිනින්දෝරු තනතුර සඳහා විවෘත තරඟ විභාගය :

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුර සඳහා පැවැත්වෙන විවෘත තරඟ විභාගය පහත අයුරු වේ.

පරීක්ෂණය පැවැත්වීමේ ක්‍රමය

| | | | |
|---|---|---|---|
| 1. | අවබෝධය | ලකුණු 50 | පැය 2 |
| 2. | බුද්ධි පරීක්ෂණය | ලකුණු 150 | පැය 1 විනාඩි 15 |
| 3. | පොදු ප්‍රශ්ණ පත්‍රය | ලකුණු 150 | පැය 3 |

යන ප්‍රශ්න පත්‍රවලට පෙනී සිට උපරිම ලකුණු ලබාගත් අය අතුරෙන් පවතින පුරප්පාඩු සංඛ්‍යාවට අනුව සුදුස්සන් තෝරා ගනු ලැබේ.

අවබෝධය : පැ. 2 ක කාලසීමාවකට සීමාවන මෙම ප්‍රශ්න පත්‍ර මගින් කෙටි පාඨ ගණනාවක් අපේක්ෂකයින් වෙත දෙනු ලැබේ. ඇතැම් පාඨ දෙනු ලබන්නේ එක් වාක්‍යයකින් ප්‍රකාශ කිරීම පිණිසයි. යටින් ඉරි ඇඳි පදවලට විවරන සැපයීමේ ප්‍රශ්නද දෙනු ලැබේ. තවත් ඇතැම් පාඨ සම්බනධයෙන් අපේක්ෂකයින් වෙත විකල්ප ප්‍රකාශ ගණනාවක් ඉදිරිපත් කරන අතර, ඉන් එකක් මෙම පාඨයේ අන්තර්ගත කරුණුවලට වඩාත්ම හොඳින් ගැලපෙයි. අපේක්ෂකයින් මෙයින් වඩාත් උචිත ප්‍රකාශය තෝරාගත ගත යුතුය. තවත් ඇතැම් පාඨ සම්බන්ධයෙන් අපේක්ෂකයා වෙත ප්‍රශ්න කිහිපයක් ඉදිරිපත් කරනු ඇත. ඒවාට නිවැරදි පිළිතුරු දීම අපේක්ෂා කෙරේ. මේ ප්‍රශ්න පිළියෙල කරන්නේ අපේක්ෂකයා එම පාඨයන්ගේ අර්ථය වටහා ගන්නා ආකාරය පරීක්ෂා කිරීම සඳහාය. මෙයට අමතරව සාරාංශ ලිවීම සඳහා දිග පාඨයක් දෙනු ලැබේ.

බුද්ධි පරීක්ෂණය : පැය එකකුත් විනාඩි 15 කට සීමාවන මෙය සකස් කර ඇත්තේ අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූල තත්ත්වයටත්, ඔහුගේ සිතෙහිද විශ්ලේෂණ තත්ත්වයත් ඔහුගේ තීරණ ගැනීමේ ශක්තියක් විනිශ්චය කිරීම සඳහාය. මෙම ප්‍රශ්න පත්‍රය බහුවර්ණ ක්‍රමයට ගැලපෙන ප්‍රශ්න වලින් යුක්ත වනු ඇත.

පොදු ප්‍රශ්න පත්‍රය : මෙය අපේක්ෂකයා වාසය කරන හා සේවය කරන පරිසරය ඇතුළුව ශ්‍රී ලංකාවේ දේශපාලනමය, සමාජමය, සංස්කෘතික හා ආර්ථික පරිසරයද, ජාතිකව හා අන්තර්ජාතිකව වැදගත්වන නූතන කරුණු මෙන්ම විද්‍යාත්මක හා කාර්මික සංවර්ධනයද සම්බන්ධයෙන් ඇති ඔහුගේ දැනීම පරීක්ෂා කිරීම සඳහා සකස් වූ පොදු ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න කිහිපයකින් තමන් කැමති ප්‍රශ්න තෝරා ගැනීමට අවසර ඇත. මෙය පැය තුනක ප්‍රශ්න පත්‍රයකි.

(ආ) පරිශිෂ්ඨය

### ශ්‍රී ලංකා මිනින්දෝරු සේවා ව්‍යවස්ථාව කාර්යක්ෂමතා කඩඉම් පිළිබඳ (ආ) පරිශිෂ්ඨය

ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ II පන්තියේ II ශ්‍රේණිය සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ දෙකකි.

I වන කාර්යක්ෂමතා කඩඉම :

II වන පන්තියේ II වන ශ්‍රේණියේ නිලධාරීන් 4 වන වැටුප් පියවරට එළඹීමට පෙර පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

1. දෙපාර්තමේන්තු මැනුම් රෙගුලාසි, නිත්‍ය නියෝග, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, රජයේ ටෙන්ඩර් පරිපාටිය.

1.1 මෙහි ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසිවල පහත සඳහන් විෂයයන්ට අදාල කරුණු මත පදනම් වූ එක් ප්‍රශ්ණ පත්‍රයකි.

(අ) ආණ්ඩුවේ මුදල් රෙගුලාසි 1 වැනි කාණ්ඩය ( X වැනි පරිච්ඡේදය හැර)

(ආ) ආයතන සංග්‍රහයේ පරිච්ඡේද I, II, III, V, VI, VII, IX, XI, XXIII, XXV, XXVI, XXVIII, XXIX, XXX, XXXI, XXXIII, XLVIII

1.2 : දෙපාර්තමේන්තු මැනුම් රෙගුලාසි, නිත්‍ය නියෝග හා සම්බන්ධ එක් ප්‍රශ්න පත්‍රයකි. මෙම විභාගය පවත්වනු ලබන්නේ විභාග කොමසාරිස් ජනරාල් විසිනි. එක් විෂයක් සඳහා අවම ලකුණු 40 ක් ලබා ගත යුතුය

2 වන කාර්යක්ෂමතා කඩඉම : II වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ නිලධාරීන් 7 වැනි වැටුප් පියවරට එළඹීමට පෙර පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය

i. මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය විසින් පවත්වන මැනුම් විද්‍යාව පිළිබඳව උසස් ඩිප්ලෝමාව හෝ

ii. මෙරට හෝ විදේශයක පිළිගත් විශ්ව විද්‍යාලයක මැනුම් විද්‍යාවට සම්බන්ධ විෂය ක්ෂේත්‍රයක පශ්චාත් උපාධි සුදුසුකම්

හෝ

iii. මැනුම් විද්‍යාව හා සම්බන්ධ විෂයයන් පිළිබඳව පශ්චාත් උපාධියක් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සමාන පාඨමාලාවකින් සමත්වී තිබීම.

පරිශිෂ්ඨය “ඇ”

i. මිනින්දෝරු දෙපාර්තමේන්තුව

ii. ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

iii. දුම්රිය දෙපරේතමේන්තුව

iv. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව

03-367

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.